## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

### ශාස්ත්‍රවේදී විශේෂ / අධ්‍යයන ධාරා උපාධි පරීක්ෂණය (භූගෝල විද්‍යාව) - පළමු භාගය

### දෙවන සෙමෙස්තර අවසාන පරීක්ෂණය –2017

## GYG 2234 - ශ්‍රී ලංකාවේ සංවර්ධන දැක්ම

පැ දෙකයි (02)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

ශ්‍රී ලංකා ආකෘති සිතියම් දෙකක් සපයනු ලැබේ.

---

1. i ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කලාප ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධක කෙටියෙන් දක්වන්න.

(ලකුණු 03)

ii ඉහත සඳහන් කළ සාධක අනුව හඳුනාගත හැකි කෘෂිකාර්මික කලාප නම් කරන්න.

(ලකුණු 05)

iii ශ්‍රී ලංකාවේ තේ වගාව ආශ්‍රිත සමාජ ආර්ථික ගැටලු නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

2. i ශ්‍රී ලංකාවේ ප්‍රධාන නිෂ්පාදන කර්මාන්ත වර්ග නම් කරන්න

(ලකුණු 02)

ii දළ දේශීය නිෂ්පාදිතය තුළ නිෂ්පාදන කර්මාන්තවල වර්තමාන දායකත්වය කෙටියෙන් පහදන්න.

(ලකුණු 03)

Iii මෑතකාලීන කර්මාන්ත ක්‍රියාවලිය තුළ ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝග නිදසුන් සහිතව විග්‍රහ කරන්න.

(ලකුණු 15)

3. i ශ්‍රී ලංකාවේ පවතින විවිධ නගර හඳුන්වන්න

(ලකුණු 02)

ii ශ්‍රී ලංකාවේ නගර ව්‍යාප්තියෙහි කැපී පෙනෙන ලක්ෂණ හඳුන්වන්න.

(ලකුණු 06)

iii කොළඹ මහනගර සභාවට අයත් නාගරික ප්‍රදේශයෙහි නාගරීකරණ ක්‍රියාවලිය ආශ්‍රිත මෑතකාලීන ප්‍රවණතා නිදසුන් සහිතව ර්මසන්න.

(ලකුණු 12)

4. i ශ්‍රී ලංකාවේ මාර්ග වර්ග කර දක්වන්න.

(ලකුණු 01)

ii ශ්‍රී ලංකාවේ මාර්ග ප්‍රවාහන අංශයෙහි මෑතකාලීන සංවර්ධන ක්‍රියාමාර්ග කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 04)

iii එම ප්‍රවාහන සංවර්ධන ක්‍රියාමාර්ගවල පාරිසරික බලපෑම නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

5. i ශ්‍රී ලංකාවේ දැනට භාවිත වන බලශක්ති මූලාශ්‍ර නම් කරන්න.

(ලකුණු 05)

ii තිරසාර බලශක්ති භාවිතය සඳහා ගතහැකි ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාව ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

6. i සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර ශ්‍රී ලංකාවේ වර්තමාන සෞඛ්‍ය සේවයෙහි තත්වය කෙටියෙන් පහදන්න.

(ලකුණු 05)

ii ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවයෙහි අනාගත අභියෝග නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 15)